**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

<u>**ප්‍රසම්පාදන දැන්වීමයි**</u>

**මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක භෝජනාගාරයක් හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට මාසික කුළී පදනම මත බදු දීම සඳහා මිල ගණන් කැඳවීම**

## කොන්ත්‍රාත්තු අංකය:- BOI/MEPP/ZM/2024/01

1. මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානයට අයත් සේවා ප්‍රදේශයේ පිහිටි භෝජනාගාරයක් හෝ වෙනත් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් වසර තුනක (03) කාල සීමාවකට බදු දීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.
   - මෙම ගොඩනැගිල්ල කොළඹ නුවර මහා මාර්ගයට යාබද ජනාකීර්ණ නිට්ටඹුව නගරයට ආසන්න මල්වත්ත හන්දියෙහි පිහිටා ඇත.
   - ගොඩනැගිල්ල පිහිටි ඉඩම පර්චස් 73.1ක වපසරියකින් යුක්ත වන අතර ගොඩනැගිල්ලේ ප්‍රමාණය වර්ග අඩි 5,150 කි.

2. මෙම ප්‍රසම්පාදනය ජාතික ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුව සිදු කෙරේ.

3. ලංසු ඉදිරිපත් කිරීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම්:
   - භෝජනාගාරයක්, ආපන ශාලාවක් හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම පිළිබඳව අවම වශයෙන් වසර තුනක (03) වත් පළපුරුද්දක් තිබිය යුතුය.
   - රජයේ අනුමත ලියාපදිංචි ආයතනයක් විය යුතුය.
   - අසාදු ලේඛණගත නොවූ ආයතනයක් විය යුතුය.
   - අවම අවුරුදු තුනක (03) වත් මූල්‍ය ශක්‍යතාවය සනාථ කිරීමට අවශ්‍ය ලේඛණ ඉදිරිපත් කළ යුතුය. (මූල්‍ය වාර්තා, බැංකු ප්‍රකාශ ආදිය)

4. මිල ගණන් ඉදිරිපත් කිරීම සම්බන්ධ විස්තර විමසීම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා (මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය) දුරකථන අංක 033-2288826 හෝ 033-2296620, 076 6175295, ෆැක්ස්: 033-2282364, විද්‍යුත් ලිපිනය: samanthip@boi.lk වෙතින් සිදු කළ හැකි අතර ලේඛණ පරීක්ෂා කිරීම 2024.06.10 දින දක්වා රාජකාරි දිනවල පෙරවරු

9.00 සිට පස්වරු 3.30 අතර කාලයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මල්වත්ත අපනයන සැකසුම් උද්‍යාන කාර්යාලය, මල්වත්ත, නිට්ටඹුව යන ස්ථානයේදී සිදු කළ හැකිය.

5. 2024.06.10 දින දක්වා රාජකාරි දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා රු.2,500.00 + 2.5% SSCL+ 18% VAT ක නැවත නොගෙවන ගාස්තුවක් ගෙවා ඉහත ලිපිනයේ පිහිටි කලාප කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා (මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛණය ලබා ගත හැකිය.

6. මෙම ප්‍රසම්පාදනයට අදාල පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) 2024.06.04 දින පෙරවරු 10.00 ට මල්වත්ත අපනයන සැකසුම් උද්‍යාන කාර්යාලය, මල්වත්ත, නිට්ටඹුව යන ස්ථානයේදී පැවැත්වීමට නියමිතය.

**සටහන:**
ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගැනීම පිණිස කලාපයට පිවිසෙන අය විසින් ජාතික හැඳුනුම්පත මල්වත්ත කලාපීය ප්‍රධාන දොරටුවේ ආරක්ෂක කාර්යය භාර නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

7. ඉදිරිපත් කරනු ලබන මිල ගණන් 2024.08.27 දින දක්වා වලංගු විය යුතුය.

8. මුද්‍රා තබන ලද මිල ගණන් සමග රු.25,000.00 ක ආපසු ගෙවනු ලබන 2024.09.24 දින දක්වා වලංගු බැංකු ඇපකරයක් හෝ මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානයේ මුදල් අංශය වෙත නියමිත මුදල ගෙවා ලබා ගත් මුදල් ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

9. මුද්‍රා තබන ලද සියලු විස්තර ඇතුලත් මිල ගණන් **2024.06.11 දින පස්වරු 02.00 ට පෙර** ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා බාරේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය, මල්වත්ත නිට්ටඹුව. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය.

10. **2024.06.11 දින පස්වරු 02.00 ට** මිල ගණන් පත් භාර ගැනීම අවසන් කළ වහාම මිල ගණන් පත් විවෘත කිරීම සිදු කරනු ලබන අතර එම දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන මිල ගණන් පත්‍ර භාර ගනු නොලැබේ. එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

11. මිල ගණන් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවර "මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක භෝජනාගාරයක් හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා මාසික කුළී පදනම මත බදු දීම" යනුවෙන් සදහන් කළ යුතුය.

12. කොන්ත්‍රාත්තුව සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

සභාපති

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.**